


**ශ්‍රී. බු. ව. 2561 ක්වූ  පොසොන් මස කලාපය, රා. ව. 2017 ක් වූ ජුනි මස 08 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# මෙලොව පිරිහීම පරලොව පිරිහීමටද පසුබිමයි.

ධම්කාමී  පින්වතුනි,

අද පොසොන් පුර පොහොය දිනයයි. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ වැඩමකොට ලක්දිව බුදු සසුන පිහිටුවීම සිහිපත් කරන දිනය හැටියට ලක් වැසි ජනතාව වෙසක් පොහොය වගේම ප්‍රබෝධයෙන් කටයුතු කරන දිනයකි. අද ධම් පණිවුඩයට මාතෘකාව සඳහා තෝරා ගත්තේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් වන සුත්ත නිපාතයේ එන පරාභව සූත්‍රයයි. පරාභව යනු පිරිහීම, විනාශය යන අර්ථයයි. මේ සූත්‍රයෙන් අපිට උගන්වන්නේ සත්වයාගේ දෙලොව පිරිහීමට සහ විනාශයට හේතූන්ය. එදා මංගල සූත්‍රය ඇසූ දෙවියෝ මිනිසුන්ගේ දියුනුවට හේතු දැනගත්හ. පිරිහීමට හේතු දැන ගැනීමද සුදුසුයයි සිතූහ. මංගල සූත්‍රය දේශණා කරන ලද දිනට පසු දින දස දහසක් සක්වල දෙවියෝ මෙම එකම සක්වළෙහි රැස්වී භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි ජේතවන විහාරයේ රැස්වූහ. ශක්‍ර දිව්‍ය රාජයාගේ නියමයෙන් එක්තරා දෙව්  පුතෙක් පනවන ලද අසුනෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේගෙන් පිරිහීමේ කරුණු විචාළේය. ඊට පිළිතුරු වශයෙන් ගාථා දෙළසකින් පරිහානි කාරණා 21ක් වදාළ සේක.  පිරිහීම හෙවත් විනාශයට හේතුවන කරුණු අඩංගු මෙම සූත්‍රය බෞද්ධ ජනතාවට ඉතා හුරු පුරුදු අපේ මහ පිරිත් පොත් වහන්සේගේද අඩංගු කවුරුත් දන්නා සූත්‍ර ධර්මයකි. එදා දෙවියන්ගේ අතිශය ඕනෑකමට

විමසන ලද මෙම පිරිහීමේ කරුණු දැන ඉගෙන දෙලොව යහපත උදකර ගනිමු. ගාථා දෙළසෙහි ලිහිල් තේරුම මුලින්ම දැනගනිමු.

✧ දසකුසල් දහම් කැමැත්තා දියුණුවේ. ධර්මයට කැමති නොවේ නම් ඔහු පිරිහේ. ✧ යමෙක් හට ශාන්ත වූ සංවරවූ සත්පුරුෂයෝ ප්‍රිය නොවේද අශාන්ත අසංවර අසත් පුරුෂයෝ ප්‍රියවේද එය පිරිහීමට මුලකි. ✧ යමෙක් නිතර නිදයිද, නිතර දොඩමළුවෙමින් කාලය කා දමයිද, නැගී සිටින වියර්‍ය නැතිද, අලසද, ඉක්මනින් තරහ යන සුලුද මේ එක එක කාරණය පිරිහීමට හේතු වෙති. ක යමෙක් පොහොසත්ව හිඳිමින් මව පියා හෝ පෝෂණය නොකෙරේද එය පිරිහීමට හේතුවකි. ✧ යම් කෙනෙක් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් හෝ වෙනයම් යාචකයකු හෝ බොරුවෙන් රවටයිද එය පිරිහීමට මුලකි. ✧ යමෙක් වස්තු සම්පත් සහ ආහාරපාන ආදිය බොහෝ තිබිය දී තනියම ඒ සියල්ල බුක්ති විඳී ද එය විනාශයට මුලකි. ✧ යමෙක් ජාති, කුල, මල, ගෝත්‍රය, ධනය ආදිය නිසා මානයෙන් සිය ඤාතීන්ට නොසලකයිද එය පිරිහීමට මුලකි. ✧ යමෙක් ගැහැණුන් කෙරෙහි ඇලී සුරාවට සූදුවට ඇබ්බැහි වී ලැබෙන දේ විනාශ කරයිද එය පිරිහීමට මුලකි. ✧ යමෙක් තම බිරිඳගෙන් සතුටු වෙමින් ගණිකාවන් සහ අනුන්ගේ බිරියන් කරා යයිද එය පිරිහීමට හේතුවකි. ✧ යමෙක් වයස ඉක්මගිය පසු තරුණියක් හා විවාහවී ඇය වෙනත් තරුණයෙකු කෙරෙහි ආලය ඇති වේ යයි හැඟීමෙන් ඉරිසියාවෙන් නොනිඳා ඇය රකියිද එයද පිරිහීමට කරුණකි ✧ කෑදර වූ ඒ නිසා වස්තුව නැති කරන ගැහැනියක හෝ පිරිමියෙකු ගෙදරක ප්‍රධානකමට පත්කරයිද එයද පිරිහීමට හේතුවකි. ✧ යමෙක් මහා තණ්හාව ඇතිව දුප්පත්ව රට පාලනය හෙවත් රජකම පතයිද එයද විනාශයට මුලකි.

මෙම කරුණු සමූහය එකටගෙන විමසනවිට පෙනී යන්නේ ස්ත්‍රී පුරුෂ භේදයෙන් තොර සමාජයේ එක්තරා පිරිසකගේ තත්වයයි. එදට වඩා මෙවන් අය අද බහුලය. මේ සූත්‍රයේ නම පරාභව යන්නයි. එනම් පිරිහීම හෙවත් විනාශයයි. එම විනාශය මිනිසුන් තුළ ඇතිවීම පිළිබඳව දෙවියන්ට ඇති වූයේ කම්පාවකි. බුදුරජාණන් වහන්සේ පහළවීමෙන් ශාසනය ආරම්භ විය. සසුනෙහි පැවැත්ම දෙවියන්ට ඉමහත් සතුටකි. මිනිසුන් තුළ දුර්ගුණ පහළ වී මිනිස් සමාජය පිරිහීම ශාසනයේද පිරිහීමයි. බුදුරජාණන් වහන්සේ පිරිහීම සඳහා දෙසූ සෑම කාරණයක්ම මෙවැන්නකින් විස්තර කිරීම අපහසුය. එහෙත් මුළු සූත්‍රය පුරාම විහිදී තිබෙන පද දෙකක් පිළිබඳව හිත යොමු කොට ඉහත දැක්වූ ගාථා දෙළහෙ සාරාංශ අර්ථය සමග ගලපා තම ජීවිතයට එහි බලපෑම කොතෙක්දැයි හඳුනා ගනිමු. සූත්‍රයේ සඳහන්වන ඒ පද දෙක ගැන විමසා බලමු. "ධම්මකාමො භවං හොති - ධම්මදෙස්සී පරාභවො" මෙහි ඉතාම සරළ අර්ථය ධර්මය හෙවත් දස කුසළයට කැමති පුද්ගලයා නොපිරිහේ. දහමට ද්වේෂ කරන්නා හෙවත් දස අකුසළයට කැමති පුද්ගලයා විනාශ වේ යන්නයි. දස කුසල්, දස අකුසල් යන වචන දෙක අද සමාජයේ යල් පැනගිය කරුණු දෙකක් සේ සැළකුවද එද බුදුහිමියන් පිරිහීමට හේතුවන පළමු කාරණය සේ

පෙන්වා දුන්නේ එය විනාශයට හේතුවන ප්‍රධාන කාරණය නිසාමය. වර්තමානය වන විට ඒ ගැන විමසා බලන්නෙකුට තේරුම් ගත හැකිය. අද බොහෝ දෙනා අගය කරන්නේ පිරිහීමට හේතුවන ක්‍රියාවන්ටය. එයින් හැඟෙනුයේ බොහෝ දෙනා දහමට ද්වේෂ කිරීමයි. කුසල් හෝ අකුසල් සිදුවන්නේ කය වචනය සිත යන දෙරටු තුනෙනි. ඒ වගේම අකුසල් සිදු කිරීමට මුල් වන හේතු තුනකි. එනම් ලෝභය , තරහව, මෝඩකම, යන තුනයි. කුසල් සිදු කිරීමට අලෝභ, අද්වේෂ, අමෝහය යන හේතු තුන මුල්වේ.

දසකුසල් කිරීම යනු ධර්මයට ඇති කැමැත්ත නම් ඔහු නොපිරිහේ. දස කුසල් යනු කයින් සිදුවන සතුන් මැරීමෙන් වැලකීම, සොරකම් නොකිරීම, කාමයෙහි වරදවා නොහැසිරීමය. වචනයෙන් සිදුවන බොරුකීමෙන්, කේලාම් කීමෙන්, පරුස වචන කීමෙන්, හිස් වචන කීමෙන් වැළකීමයි. සිතින් සිදුවන දැඩි ලෝභයෙන්, ක්‍රෝධ කිරීමෙන්, මිථ්‍යා දෘෂ්ඨියෙන් වැලකීමයි. මිහිඳු හිමියන් අපිට කියාදුන්නේ ද ඒ සම්බුදු දහමයි.

ඉහත කී කුසල් දහය නොකොට සතුන් මැරීම ආදී අකුසල් දහය සිදු කිරීම ධර්මයට අකමැත්තයි. සූත්‍රයේ සඳහන් සෑම පිරිහීමේ කාරණයකින්ම පෙනී යන්නේ එම පිරිහීමේ කාරණයන්ට නතු වූ පුද්ගලයා පරාභවයට හෙවත් විනාශයට යන බවයි. ඒ මෙලොව පරිහානිය ඒකාන්තයෙන්ම පරලොව පරිහානියට මග පාදයි. ධර්මයට පිටු පෑම අධර්මය පිළිගැනීම හෙවත් මිථ්‍යා අදහස්වලට ගරු කිරීම සූත්‍රයේ දැක්වෙන හැම පිරිහීමකටම මුල වෙයි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මනුෂ්‍යයා පිරිහෙන්නේ සාරධර්මවලින් ඉවත් වීමෙනි. ඒ පිරිහෙන පුද්ගලයාගේ පළමු ලකෂණයයි. මෙලොව එසේ දස අකුසල් ප්‍රියකර ජීවත් වී පරළොව දුගතියෙහි උපදී.

ඊළඟ පිරිහීමේ දෙරටුව අසත්පුරුෂයන් ප්‍රිය කිරීමයි. අධර්මවාදියාට ප්‍රියවන්නේ අසත් පුරුෂයාමයි. බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා හෝ ඉන් පහළ සත් පුරුෂයෝ ඔහු ප්‍රිය නොකරයි. බෞද්ධ නාමයෙන් ඇතැමුන් පෙනී සිටියත් වෙසක් හා පොසොන් කළාප, සැණකෙලි, මහා තොරණ, මහා දන්සල්, සිදුකළත් ධර්මය ප්‍රිය නැතිනම් ඇසුර අසත්පුරුෂ ඇසුරයි. සමාජයේ උසස් තලවල වැජඹුනත් ඇසුර යහපත් නොවේ නම් කොතරම් ධනයෙන් කුලයෙන් බලයෙන් ඉහල වූවද ඔහු පිරිහේ. එමෙන්ම ඔවුන් බුද්ධා දී උතුමන්ගේ දහමට වඩා මිසදිටු දහම ප්‍රියකරයි. මිසදිටු ආකල්ප අනුව කටයුතු කරති. ධනවත්කම නිසා රටෙන් පිට ගොස් හෝ අධර්මය ඇසුරු කරති. එසේ කිරීම ඔවුන් උසස් තත්වයක් සේ සළකති. ඒ නිසාම ඔවුන්ගේ ඇසුරද එවැන්නෝමය.

යමෙකුගේ උද්‍යෝගිමත් කම, කායජීශීලී ගතිය අඩුද නිතර නිදයිද රංචු ගැසී නිරර්ථක දේ කථා කරමින් කාලය කා දමයිද නැගී සිටින වියජී නම් වූ පෞරුෂය නැතිද, වහා කිපෙන සුලුද ඒ එක එක කාරණා පිරිහීමට හේතූන්ය. ධර්මය ප්‍රිය කරන කෙනෙකුට නම් ඉහත කී ගතිගුණ නොපිහිටයි. සත් පුරුෂ කල්‍යාණමිත්‍ර ඇසුරද ඔහුට නැතිකම ඊට හේතුවේ.

යමෙක් අගහිඟකමින් තොරව පොහොසත්ව හිඳිමින් මවුපියන් පෝෂණය නොකරයිද එය පිරිහීමේ හේතුවකි. භෞතික සැප සම්පත් වලින් පොහොසත් වුවද ඔහු ධර්මයෙන් දුප්පත් කම මෙයට හේතුවයි. ධර්මයට ද්වේෂ කිරීම නිසා බව මෙයින් ද තහවුරු වේ.

යමෙක් ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් හෝ නැතිකම නිසා අනුන්ට අත පා පීවත් වන්නවුන් බොරුවෙන් රවටයිද එය පිරිහීමේ කාරණයකි. අද පූජනීය ලෙසින් ලෝකයා රවටන පිරිස් බහුල බැවින් සැබෑ ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ටද ගැටලුවකි. යාචක තත්ත්වයේ පසුවන සැබෑ චරිත දුකට පත්වන්නේද වංචාකාරයින් නිසාය. සංවිධානාත්මක යාචක ව්‍යාපාර පවත්වන ධනවතුන් සිටින බව අද නොරහසකි. ඔවුන්ද ධර්මය ප්‍රිය නොකරන අධර්මවාදීන්ය. එබැවින් සැබෑ පූජනීය උතුමන් සහ අසරණ වූවන් හඳුනා ගෙන බොරුවෙන් නොරැවටිය යුතුය. මන්ද යත් විපාක බරපතල නිසාය. පිරිහීමට හේතුවක් වන බැවිනි. ධර්මය ප්‍රිය කරයි නම් සිල්වතුන් හඳුනති. දීමෙහි අනුසස් දනිති. අසරණයන් හඳුනති.

යමෙක් බොහෝ වස්තුව ඇතිව රස මසවුලු ඇතිව එම ආහාර පාන තනිව කිසිවකුට නොදී පරිභෝජනය කරයිද එය පිරිහීමට මුලකි. මෙහිදී තමන් උපයා සපයාගත් සියලු දේ අනුන්ට දන් දෙන්න යයි වරදවා නොගත යුතුයි. බොහෝ සැප සම්පත් ඇතිව ඒවා තනිව බුක්ති විඳින්නන් අප අසා ඇත. බුද්ධකාලීන මසුරු සිටාණෝ එවැන්නෙකි. බෞද්ධ සමාජයේ ඉහවහා ගිය සම්පත් නොතිබුනත් තියන හැටියට බෙදහදා ගැනීම සිරිතකි. එකවෙහෙර වැඩ සිටින භික්ෂූන් වහන්සේලා වුවද ලද පිණ්ඩ ආහාරය බෙදගෙන වළඳති. දීමෙහි ආදීනව සහ පින සහ පව දන්නේ දහම ප්‍රිය කරන්නෙකු පමණි. පසුගිය දිනවල ගංවතුරින් පීඩාවූවන්ට බොහෝ දෙනා සංග්‍රහ කළේ එම ගුණය පිරිහී නැති නිසාය.

යමෙක් ජාති ගෝත්‍ර කුලයෙන් ධනයෙන් මත්වී සිය ඤාතීන්ට නොසළකයිද ඔහු පිරිහේ. ධර්මය ප්‍රිය කරන කෙනෙකු එසේ නොකරයි මෙලොවදීම පිරිහෙන බව ඔහු දන්නා නිසාය.

යමෙක් ස්ත්‍රීන් පිළිබඳව සහ සුරාවට සූදුවට ලොල්වේ නම් ලැබෙන ලැබෙන ධනය ඒ සඳහා ඔහු නොදැනුවත්වම වැයවේ. මෙලොව එසේ පිරිහී පරලොව පිරිහීමද එයින් සකස් වේ. මේ පිළිබඳව උදහරණ වත්මන් සමාජය තුල ඕනෑතරම් ඕනෑකෙනෙකුට හැමද මාධ්‍යතුළින්ද දැකගත දැනගත හැකිය. සමාජයේ එවැනි චරිත කව්රුත් හඳුනති. එනමුත් විවෘත රහස්ය. ධර්මය ප්‍රිය නොකිරීම මෙවැන්නන් ලඟ ඇති සහජ ගතියකි.

මීලඟ පිරිහීමේ කාරණය ඉහත කී ස්ත්‍රී ලොල්වීම ට සමාන තම බිරිඳගෙන් සතුටු වෙමින් පරඹුවන් හා වෙසඟනන්කරා යයිද එය පිරිහීමේ මූලයකි. නිත්‍ය සීලය වූ පංච සීලයේ තෙවෙනි ශික්ෂා පදය තුලින් මෙම පිරිහීම වලක්වන්නේ ධර්මය ප්‍රියකරන්නෙකුටය. වත්මන් සමාජයේ මෙම පිරිහීම ඉතා වේගවත්ව සිදුවන බව නිතර අසන්නට දකින්නට ලැබේ. උපන් දරුවාද නූපන් දරුවාද මරා දැමීමට බහුතරයක් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම පෙළඹෙනුයේ මෙම පිරිහීම නිසාය. මෙයද ධර්මය ප්‍රියනොකරන්නෙකුගේ ලක්ෂණයකි.

මීලඟ පිරිහීමේ කාරණය වන්නේ වයස ඉක්ම ගිය පසු තරුණියක හා විවාහපත්ව වෙනත් තරුණ කෙනෙකු සමග ඇය ආලයක් ඇතිවේ දැයි සැකයෙන් කාමුක බවින්ද ඉරිසියාවෙන්ද දැවෙමින් ජීවනෝපායකවත් නොයෙදෙමින් අසාමාන්‍ය ලෙස බිරිඳ මුරකිරීමය එය පිරිහීමේ දොරටුවක් බවට වදළහ.

යමෙක් ප්‍රණීත ආහාර සහ සුරාව ආදී මත් ද්‍රව්‍ය කෙරෙහි කෑදරව ඒ නිසාම වස්තුව නැති කරන පිරිමියකු හෝ ගැහැනියක ගෙදරක හෙවත් ඉසුරු සම්පත්හි අධිපති කමට පත් කරයිද මුල් තැන තබයිද ඔහු ඒ වරදින් ධනය නැතිකර ගැනීමෙන් ව්‍යාපාර ආයතනයක් ගෙදරක් හෝ වේවා එම ආයතනයත් එහි සෙසු පිරිසත් ඔහුත් පිරිහේමය.

රැස්කර ගන්නා ලද අඩු සම්පත් ආයෝජන නොකොට නැවත ආදයමක් ඇතිනොවී දැඩිව සම්පත් කෙරෙහි කෑදරව යමකින් සෑහීමකට පත් නොවී රාජ්‍ය පාළනය සඳහා ඉදිරිපත් වේද තමා සතු අඩු සම්පත් සහ මහා අසීමිත ආසාව නිසා ඔහු පිරිහේ එවැන්නෙක් රාජ්‍ය පැතීම බලවත් පිරිහීමකි.

ගාථා දෙළහකින් දේවතාවා පිරිහීමේ කරුණු විමසීය. ගාථා දෙළහකින් කරුණු වදරා දේවතාවා අතිශය සෑහීමකට පත්වූ බව දැනගත් බුදුරජාණන් වහන්සේ දහතුන්වෙනි ගාථාවෙන්.

"එතෙ පරාභවෙ ලොකෙ - පණ්ඩිතො සම වෙක්ඛිය

අරියො දසසන සමපනෙනා - සලොකං භජතෙ සිවං”

“ප්‍රඥවන්තයා මාර්ගඵලාවබෝධයක් නොකළත් පරාභව කරුණු වලින් දුරු වී ආයර්‍ය නාමයට සුදුසුකම් ලැබී මිථ්‍යා දෘෂ්ඨි පටලයෙන් මිදී දහමට අනුව බලන්නට පුරුදු වීමෙන් උපද්‍රව නැති දෙව්ලොව ඇසුරු කරයි” යනුවෙන් වදළහ. අඳුරට ශාප නොකොට එක පහනක් හෝ දල්වනවා සේ සමාජය පිරිහෙනවායයි පසු තැවිල්ලට වඩා තම තමන් විසින් පරිහානියට හෙවත් විනාශයට හේතුවන එබඳු කරුණු වලින් දුරු වී දෙලොව දියුනුවට හේතුවන මංගල කාරණයන් පුරුදු කරමින් පවින් තොරව පින් දහම්හි යෙදී මිහිඳු මහරහතන් වහන්සේද ලක්වාසීන්ට නොපිරිහීමට කියාදුන් මෙම දහමෙහි යෙදීමෙන් මිහිඳු හිමියන්ට ගරු කිරීමටද මිනිසත් බව අර්ථවත් කර ගැනීමටද පොසොන් පුර පොහෝද අධිෂ්ඨාන කර ගනිමු.

